සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

40 S I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ............................................... පෙරදිග සංගීතය - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (5) ලකුණ යොදන්න.

01. ග ප ධ ප ග රි ස, ස ධ ස රි ග, යන ස්වර සංගතිය අයත් වන රාගය

(1) බිලාවල් වේ. (2) භූපාලි වේ. (3) යමන් වේ. (4) කාෆි වේ.

02. සංගීත විෂය හදාරන ආධුනිකයෙකු මුලින්ම පුහුණු විය යුතු සංගීතාංගයක් වන්නේ

(1) තානාලංකාරය (2) මධ්‍යලය ගී (3) ස්වර අභ්‍යාසය ය. (4) රාග ආලාප ය.

03. ගුප ධනි සනි ධප । මග මරි සරි ස - මෙම තානාලංකාරය ගැයීමට සුදුසු රාගය කුමක් ද?

(1) භූපාලි (2) යමන් (3) කාෆි (4) බිලාවල්

04. ආරෝහණයේ දී ස්වර 6ක් අවරෝහණයේ දී ස්වර 7ක් යෙදේ නම් රාග ජාතිය

(1) සම්පූර්ණ - ඖඩව (2) ඖඩව - සම්පූර්ණ (3) ඖඩව - ෂාඩව (4) ෂාඩව - සම්පූර්ණ

05. 'සරිසග' යන ස්වර රටාව භූපාලි රාගයට අනුව ලිවීමේ දී ඊළඟට යෙදිය යුතු පියවර කුමක් විය හැකි ද?

(1) රි ග රි ම (2) රි ග රි ප (3) රි ප ග ධ (4) රි ග ම ප

06. විකෘති ස්වර එකක් යෙදෙන රාගයකි.

(1) කාෆි (2) භෛරවී (3) යමන් (4) භූපාලි

07. නාද උත්පාදනයේ දී තත්පරයකදී සිදුවන කම්පන වාර ගණන

(1) සංඛ්‍යානයයි (2) විරලනයයි (3) ධ්වනියයි (4) සම්පීඩනයයි

08. බටහිර සංගීතයේ $\frac{5}{8}$ Time signeture ට ගැළපෙන හින්දුස්ථානි තාලය කුමක් ද?

(1) දීප්චන්දි (2) බෙම්ටො (3) ජප් (4) දාදරා

09. දොළොස්මත් පැදියක් වන්නේ මින් කුමක් ද?

(1) මනමත් කරවන දන මුළු දෙරණා (2) සඳවා සුදුවැලි පිවිතුරු

(3) රූ රුසේ අඳිනා ලෙසේ අත් (4) පැහැසරණිය මිණිපැමිණිය

10. අනාසාතාත්මක ගණයට අයත් නොවන සේගී පැදියකි.

(1) පතල් ගී (2) පාරු ගී (3) ප්‍රශස්ති ගී (4) පැල් ගී

11. උත්තර භාරතීය සංගීතයේ ආභාසය ලද නාට්‍ය විශේෂයකි.

(1) නූර්ති (2) කෝලම් (3) නාඩගම් (4) සොකරි

12. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන තාලවාද්‍ය භාණ්ඩය වන්නේ

(1) ගැටබෙරයයි (2) තම්මැට්ටමයි (3) දෙවොල් බෙරයයි (4) දවුලයි

13. තබ්ලාවේ චාන්ටියේ වාදනය වන අක්ෂරයකි.

(1) ති (2) තු (3) නා (4) ට

14. ''සමන්කාන්ති'' යන වචනයේ ඇති අක්ෂර

(1) ලඝු 2 ගුරු 1 ප්ලුත 1කි
(2) ලඝු 4 ගුරු 2 ප්ලුත 1කි
(3) ලඝු 1 ගුරු 2 ප්ලුත 1කි
(4) ලඝු 3 ගුරු 1 ප්ලුත 1කි


15. සුළු මැදුම් දෙතිතට ගැළපෙන ගී පාදය තෝරන්න

(1) රන්වන්පාටයි සමනලයා
(2) මොර හිඹුටු දම් පනා
(3) සඳවා සුදුවැලි පිවිතුරු
(4) රැගත් සුරා පිරුවිතින්

16. රාගයක නො යෙදෙන එහෙත් අල්ප වශයෙන් යොදා ගනු ලබන ස්වර විශේෂය කුමක් ද?

(1) වර්ජිත (2) වාදී (3) සංවාදී (4) විවාදි

**පහත දී ඇති බටහිර ප්‍රස්තාරය ඇසුරින් ප්‍රශ්න අංක 17 සිට 21 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




17. අංක 3 සංකේතයෙන් පෙන්නුම් කරන්නේ කුමක් ද?

(1) Crotchat rest (2) Quaver rest (3) Minim rest (4) Semibreve rest

18. ඉහත ප්‍රස්තාරයේ විකෘති වන ස්වරය බටහිර ක්‍රමයට හඳුන්වන්නේ කෙසේ ද?

(1) $D^b$ (2) $B^b$ (3) $G^b$ (4) $A^b$

19. Key Signature (කී සිග්නේචර්) පෙන්නුම් කරන අංකය කුමක් ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4

20. අංක 05 පෙන්නුම් කරන්නේ මාත්‍රා කීයක ස්වරයක් ද?

(1) 4කි (2) 3කි (3) 2කි (4) 1කි.

21. ඉහත ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කළ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) | + ම - | ම ප ධ | ධ - ම | - ප - | ධ - - |
(2) | + + ම | ප ධ නි | ධ - ම | - - ප | ධ - - |
(3) | + + ම | ප ධ නි | ධම - | - - ප | ධ - - |
(4) | + + ම | ප ධ නි | ධ - ම | - - ප | ධ - - |

22. ශකීර් හුසේන්, හරිප්‍රසාද් චෞරසියා, රවි ශංකර් යන වාද්‍ය ශිල්පීන් ප්‍රගුණ කළ වාද්‍ය භාණ්ඩ පිළිවෙළින්

(1) බටනලාව - තබ්ලාව - සිතාරය
(2) තබ්ලාව - වයලීනය - සිතාරය
(3) තබ්ලාව - බටනලාව - සිතාරය
(4) තබ්ලාව - සිතාරය - බටනලාව

23. මැදුම් තනිතිත හා දෙසුළු මැදුම් තුන්තිත යන තිත්රූප දෙකකට ගැයෙන වන්නමකි.

(1) උකුසා (2) නෛයඩි (3) තිසරා (4) කෝකිල

24. විෂමග්‍රහයෙන් ගැයීමට සුදුසු ගී පාදය තෝරන්න.

(1) ව/දිම්ව/දිම්ව /දිම් s/ s මු නි /
(2) +සසර/වසන/තුරුs /s s s
(3) පෙරදිග/මුතු ඇට/යයි මේ s/ssss
(4) | මොර | හිඹුටු | දම් | පනා |


25. ව්‍යවහාරික සංගීතයේ දී සරල ගීතයක ''පෙරවාදනය'' හඳුන්වනු ලබන්නේ කෙසේද?

(1) Interlude (2) Introduction (3) chorus (4) Counter Point

26. ශබ්ද විකාශන ......... මෙවලම් භාවිතයේ දී තමාවෙත ලැබෙන සංගීත නාදය හෝ කටහඬ විවිධ ආකාරයෙන් වෙනස් කිරීමේ කාර්යය කරනු ලබන උපකරණය කුමක් ද?

(1) Speaker (2) Mixer (3) Microphone (4) Amplipayer

27. ස-ගග/ස-ගග/ප-මග/රි - - - මෙම ප්‍රස්තාරයේ දෙවන විභාගයට යෙදීමට සුදුසු repitation mark එක වනුයේ පහත කුමන සංකේතයද?

(1)  (2)  (3)  (4) 

28. ස - ග/ ම - - / ප - ම/ ග - - මෙම ප්‍රස්තාරයට සුදුසු Harmoney එක වනුයේ කුමන ස්වර පාදය ද?

(1) රි - ම / ප - - /ධ - ප /ම - -
(2) ධ - ප/නි - - /ප - ධ/ප - -
(3) ග - ප / ධ - - / නි - ධ/ ප- -
(4) නි - රි / ධ - - / ප - ධ / ප - -

29. ජන ගී ආශ්‍රිත සරල ගීයක් <u>නොවන්නේ</u> කුමන ගීතය ද?

(1) ආදරයේ උල්පත වූ අම්මා
(2) රුක් අත්තන මල මුදුනේ
(3) දෑතට වළලු
(4) සාදු දන්තදා

30. ස්වර පිහිටීම අතින් සමාන තත් වාද්‍ය භාණ්ඩ යුගලය වන්නේ

(1) වයලීනය - එස්රාජය වේ
(2) සිතාරය - එස්රාජය වේ
(3) එස්රාජය - ගිටාරය වේ
(4) වයලීනය - ගිටාරය වේ

31. ''ජිං කිටිතක් තක් කිටිතක'' මෙම බෙරපදය වාදනය සුදුසු වාද්‍ය භාණ්ඩය වන්නේ කුමන භාණ්ඩය ද?

(1) තම්මැට්ටම (2) ගැටබෙරය (3) දවුල (4) දෙවොල් බෙරය

32. ජන නාද මාලා සංරක්ෂණය කොට දේශීය ජන සංගීතයට මුල්තැනක් දී කටයුතු කළ මුල්ම සංගීතඥයෙකි.

(1) රෝහණ වීරසිංහ මහතා. (2) වික්ටර් රත්නායක මහතා.

(3) බී. වික්ටර් පෙරේරා මහතා. (4) ඩබ්ලිව්. බී. මකුලොළුව මහතා.

33. සබරගමු වන්නමේ අන්තර්ගත කොටසක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) බෙරපදය (2) කලාසම (3) ඉරට්ටිය (4) අඩව්ව

34. ''සුවඳ පද්ම ඕලු ආදි'' මෙම ගී පාදය සඳහා වාදනයට සුදුසු තාලය හා ආවර්ත ගණන සඳහන් පිළිතුර කුමක් ද?

(1) දාදරා - ආවර්ත 4කි (2) දාදරා - ආවර්ත 2කි

(3) ලාවනී ආවර්ත 2 (4) කෙහෙර්වා - ආවර්ත 1කි

පහත දී ඇති ගී පද ඇසුරින් ප්‍රශ්න අංක 35 - 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A දොඩම් කපාලා ඇඹුල් තනාලා

B සීත ගඟුලෙදී ඇඳ පේවෙනවා

C රූ රැසේ අදිනා ලෙසේ අත්

D පැහැසරණිය මිණි පැමිණිය

E වෙල්යායක ගොන්දෙන්නෙක් කකා උනී

35. ආනාසාතාත්මක ගැමි ගීයක් ඇතුළත් අක්ෂරය කුමක් ද?

(1) A (2) C (3) E (4) D

36. ගැමි ගී ගණයට ඇතුළත් වන්නේ කුමන අක්ෂරවලට අයත් ගී පාදයන් ද?

(1) A . B . C (2) A . C. E (3) A. C. D (4) A. B. E

37. සේගී වලට ඇතුළත් ගී පාද අයත් අක්ෂර මොනවාද?

(1) C - D (2) A - B (3) D E (4) B C

38. ගුත්තිල කාව්‍යය හා සැළලිහිණි සංදේශයට අයත් කාව්‍ය දෙකක් ඇතුළත් අක්ෂර පිළිවෙළින් සඳහන් පිළිතුර කුමක්ද?

(1) C - D (2) D C (3) D B (4) C B

39. ''මනමත් කරවන දන මුළු දෙරණා'' යන ගී පාදයේ සදැස්මත් හා ගීමත් ගණන සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද?

(1) 15 - 16 (2) 16 - 16 (3) 15 - 24 (4) 16 - 18

40. සංගීත නිර්මාණය කිරීම සඳහා යොදාගනු ලබන මෘදුකාංගයකි. (Soft ware)

(1) SOUND FORGE (2) CAKE WALKE (3) ADOBE AUDITION (4) ACID PRO

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

40 S II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ............................................ පෙරදිග සංගීතය - II කාලය : පැය 02යි.

සැලකිය යුතුයි.

I පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

01. (i) ''ගපමගමරිස'' මෙම ස්වර සංගතිය යෙදෙන රාගය කුමක් ද,

(ii) බිලාවල් හා භූපාලි යන රාග දෙකේ යෙදෙන ස්වර වල ඇති සමාන ලක්ෂණය කුමක් ද,

(iii) තබ්ලාවේ වම හා දකුණ කොටස් දෙක පිළිවෙළින් නම් කරන්න.

(iv) නිර්දේශිත තාල පදවලින් 'ක' අක්ෂරය යෙදෙන තාල පද දෙකක් නම් කරන්න.

(v) අත්ලෙන් තබ්ලා පද නිරූපණය කිරීමේ දී වියෝජනය හෙවත් අත් ඉවතට නිරූපණය කිරීම සංකේතවත් කරන තාල සංඥාව හඳුන්වන නම කුමක් ද?

(vi) කාෆී රාගයේ ගායන සමය කුමක් ද?

(vii) සංගීතමය නාද විද්‍යුත් අංකිත ක්‍රමයකට පරිවර්තනය කිරීම හඳුන්වන ඉංග්‍රීසි කෙටි යෙදුම කුමක් ද?

(viii) විද්‍යා විෂයේදී ගණනය කර ඇති ආකාරයට ෂඩ්ජයෙහි සංඛ්‍යාතය 256ක් නම් 3:4 අනුපාතය අනුව ලැබෙන අගය කුමන ස්වරයට අයත්වේද?

(xi)

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | බුද් | ධ | ං | ස | ර | ණෝ | s | s | s | s | s |

මෙම ගීපාදය ගායනයට සුදුසු තිත කුමක් ද?

(x) ඉහත ගී පාදයේ පළමු මාත්‍රාවේ ඇති නිහඬ මාත්‍රාව මත ආඝාතය තැබීම ජන සංගීතයේ දී හඳුන්වන්නේ කෙසේද? ලකුණු 12

02. දී ඇති රාග විස්තර වගුව සම්පූර්ණ කරමින් අසා ඇත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පහත දී ඇති රාග විස්තර වගුව තුළ ඇති හිස්තැන්වලට අදාළ අක්ෂර ලියා ගැළපෙන පිළිතුර ලියන්න. (ල. 05)

| රාගය | ආරෝහණ | අවරෝහණ | වාදී ස්වරය | සංවාදී ස්වරය |
|---|---|---|---|---|
| a. | ස රි ග ම ප ධ නි ස | b. | ධ | c. |
| කාෆී | d. | e. | ප | f. |
| g. | h. | i. | ග | j. |

(ii) ඉහත වගුවේ සඳහන් රාග අතුරින් සම්පූර්ණ ජාතියට අයත් රාගයක මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර අදාළ තාලයේ නම ලියා දක්වන්න. (ල. 05)

(iii) ඔබ කැමති නිර්දේශිත රාගයක් නම් කොට ඊට ගැළපෙන තානාලංකාර දෙකක් මාත්‍රා අටකට නොඅඩුව ලියා දක්වන්න. (ල. 1 1/2 5 2 = 12)

03. පහත දී ඇති නිර්දේශිත රාගවලට අදාළ තොරතුරු අයත් රාග හඳුනාගෙන නම් කරන්න. ලකුණු 05

(i) a මධ්‍යමය තීව්රව යෙදේ. ජාතිය සම්පූර්ණය

b ශුද්ධ මධ්‍යමය වාදී වන අතර තීව්ර මධ්‍යමය විවාදී වේ.

c මධ්‍යමය හා නිශාදය වර්ජිතය ජාතිය ඖඩව වේ.

d මධ්‍යමය ශුද්ධව යෙදෙන අතර ග. නි. කෝමලය.

e මධ්‍යමය ශුද්ධය ජාතිය සම්පූර්ණ වේ.

(ii) ඔබ කැමති නිර්දේශිත රාගයක සර්ගම් ගීතය ස්ථායි හා අන්තරා කොටස් දෙකම ප්‍රස්තාර කරන්න. (ල. 06)

(iii) දිවා කාලයේ හා රාත්‍රි කාලයේ ගායනය වාදනය කරන රාග දෙකක් පිළිවෙළින් නම් කරන්න. (ල. 1/2 5 2 = 01)

04. (i) කහෙර්වා තබ්ලා පදයේ යෙදිය යුතු තාල සංඥා දෙක නම් කරන්න. (ල. 02)

(ii) ත්‍රිතාලය, ජප් තාලය, දීප්චන්දි තාලය යන තාල පදවලින් දෙකක් නියමිත තාල සංඥා යොදා ප්‍රස්තාර කරන්න. (ල. 08)

(iii) ඉහත ඔබ විසින් ප්‍රස්තාර කරන ලද තාල පද දෙකේ මාත්‍රා කැටිවීමට සමාන දේශීය තාල පදවල නම් පිළිවෙළින් ලියා දක්වන්න. (ල. 02)

05. (i) සබරගමු වන්නමක් වන කෝකිල වන්නම සඳහා වාදනය වන දේශීය තාල රූප දෙක හඳුන්වන්න. (ල. 02)

(ii) කෝකිල වන්නමේ තාල රූප දෙකට අයත් ගීතයේ ස්වර ප්‍රස්තාරය ලියා දක්වන්න. (ල. 08)

(iii) කෝකිල වන්නමේ තාල රූප දෙකින් එකකට අයත් තානම පද ප්‍රස්තාර කර දක්වන්න. (ල. 02)

06. (i) පෙරදිග සංගීතයේ ස්වර ප්‍රභේදය අනුව,
කෝමල, තීව්ර, අචල ස්වර යතුරු පුවරුවක ලකුණු කර දක්වන්න. (ල. 05)

(ii) බටහිර සංගීතයේදී sharp (තීව්ර) Flat (කෝමල) ස්වර නියමිත සංකේත සහිතව ඉංග්‍රීසි අක්ෂරවලින් ලියා දක්වන්න. (ල. 05)

(iii) පහත සඳහන් බටහිර ප්‍රස්තාරයේ විභාග <u>හතරට</u> ගැළපෙන CHORDS (කෝඩ්ස්/ ස්වර සංචයන්) තුන පිළිවෙළින් ලියා දක්වන්න.



(ල. 02)

07. පහත දී ඇති සංගීතඥයින්ගෙන් දෙදෙනෙක් පිළිබඳව ඔවුන්ගේ ජීවන තොරතුරු ඇතුළත් කරමින් බිත්ති පුවත්පතකට ගැළපෙන අයුරින් ලිපි දෙකක් ලියා දක්වන්න.

1. ඩබ්ලිව්. බී. මකුලොලුව
2. සී ද එස්. කුලතිලක
3. හරිප්‍රසාද් චෞරසියා
4. රවි ශංකර්
5. ඒ. ආර්. රහුමාන්
6. ජග්ජිත් සිං
7. ලයනල් රංවල
8. රෝහණ බැද්දගේ

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

40 | S | I - II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

### පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

#### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (2) | 11. | (1) | 21. | (2) | 31. | (3) |
| 2. | (3) | 12. | (4) | 22. | (3) | 32. | (4) |
| 3. | (4) | 13. | (3) | 23. | (4) | 33. | (3) |
| 4. | (4) | 14. | (1) | 24. | (1) | 34. | (2) |
| 5. | (2) | 15. | (2) | 25. | (2) | 35. | (3) |
| 6. | (3) | 16. | (4) | 26. | (2) | 36. | (4) |
| 7. | (1) | 17. | (3) | 27. | (1) | 37. | (1) |
| 8. | (3) | 18. | (2) | 28. | (3) | 38. | (1) |
| 9. | (2) | 19. | (2) | 29. | (4) | 39. | (2) |
| 10. | (3) | 20. | (2) | 30. | (2) | 40. | (2) |

#### II කොටස

01.

| | | ලකුණු |
|---|---|---|
| (i) | බිලාවල් | 1 |
| (ii) | ශුද්ධ ස්වර වීම | 1 |
| (iii) | බායන් - දායන් | 2 |
| (iv) | කහෙර්වා, ලාවනී (බෙම්ටෝ) | 2 |
| (v) | බලිය, බලිස්ථානය, බලි | 1 |
| (vi) | රාත්‍රී දෙවන සමයේ | 1 |
| (vii) | MIDI | 1 |
| (viii) | මධ්‍යමයයි (ම. ස්වරයයි) | 1 |
| (ix) | මැදුම් තනිතිත | 1 |
| (x) | අවග්‍රහය | 1 |
| | | 12 |

02. (i)
a බිලාවල්

b ස් නි ධ ප ම ග රි
c ග
d ස රි <u>ග</u> ම ප ධ <u>නි</u> ස්
e ස් <u>නි</u> ධ ප ම <u>ග</u> රි ස
f ස්
g භූපාලි
h ස රි ග ප ධ ස්
I ස් ධ ප ග රි ස
j ධ

ලකුණු 1/2 5 10 = 5 කි.

(ii) බිලාවල් හෝ කාෆි රාග දෙකෙන් එකක මධ්‍යලය ගීතය හෝ වාදිතය ස්වර ප්‍රස්තාර කිරීම නිවැරදි නම් ලකුණු (ල. 04)
තාලය නම් කිරීමට (ල. 01)

(iii) මාත්‍රා අටකට නො අඩු නිර්දේශිත රාගයකට අදාලව තානාලංකාර දෙකක් ලියා ඇතිවිට
(ලකුණු 1 5 2 = 02)
මුළු ලකුණු 12

03. (i) a යමන් b භෛරවී c භූපාලි d කාෆි
e බිලාවල් (ලකුණු 05)

(ii) නිර්දේශිත රාගයක සර්ගම් ස්ථායි කොටසට (ල. 03)
අන්තරා කොටසට (ල. 03)

(iii) දිවා කාලයේ රාග - බිලාවල් /භෛරවී
රාත්‍රී කාලයේ රාග - යමන්/භූපාලි/කාෆි
ලකුණු 1 1/2 5 2 = 01
මුළු ලකුණු 12

04. (i) සම්/සමස්ථානය/සමග්‍රහය/සහ
බලි/බලිස්ථානය ල. 02
(5/0) සංකේත පමණක් ඇතිවිට ලකුණු 1යි

(ii) නියමිත තාල සංඥා යොදා ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු 4 5 2 = 8
තාල සංඥා නොමැතිවිට
ලකුණු 2 5 2 = 4යි

(iii) ත්‍රිතාලය - මහතනිතිත
ජප් - සුළු මැදුම් දෙතිත
දීප්චන්දි - මැදුම් මහ දෙතිත මින් දෙකක්
නම් කර ඇතිවිට ලකුණු 02කි

**Answer**

05. (i) මැදුම් තනිතිත හා දෙසුළු මැදුම් තුන්තිත
ලකුණු 02
(ii) තාල රූප දෙකට අනුව ස්වර ප්‍රස්තාරයේ නිවැරදිව ලියා ඇත්නම් ලකුණු 08
(iii) තානම පද ප්‍රස්තාරකර ඇතිවිට ලකුණු 02
පද පමණක් ලියා ඇතිවිට ලකුණු 01

06. (i) කෝමල ස්වර (4) රි ග ධ නි ල. 1
තීව්‍ර ස්වරය (1) ම් ල. 1
අචල ස්වර (2) ස ප ල. 1
යතුරු පුවරුවක නිවැරදිව ලකුණු
කර ඇත්නම් ලකුණු 03 + 02 = 05
(ii) C# D#, F# G# A#
Db Eb Gb Ab Bb

(iii) C, F, G, C ලකුණු 4 5 1/2 = 02
මුළු ලකුණු 12

07. දී ඇති සංගීතඥයින් දෙදෙනෙකු පිළිබඳව බිත්ති පුවත් පතකට ගැළපෙන සේ ඔවුන්ගේ ජීවන තොරතුරු ඇතුළත් කොට ඇත්නම්
ලකුණු 6 5 2 = 12

## ගුරු භවතුන්ගේ දැනගැනීම සඳහා

ඛෙම්ටො තාලය - මාත්‍රා 12 විභාග 4

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| යේකාව | ධා | ති | ධි | නා | ති | නා | තා | ති | ධි | නා | ධි | නා |
| තාල සංඥා | 5 | | | 2 | | | 0 | | | 3 | | |

හීන්ච් තාලය මාත්‍රා 6 - විභාග 2

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| යේකාව | ධිං | නධි | ධින | තිං | නධි | ධින |
| තාල සංඥා | 5 | | | ० | | |